# ක්‍රිස්තියානි නූතනත්ව විවාහය

අප රටේ විවාහය ඒක පුරුෂ ඒක භාර්යා යන්න සම්මතය කරගෙන පවත්වාගෙන ගිය ද ඒ සම්බන්ධයෙන් දැඩි නීති රීති තිබූ බවක් නො පෙනෙයි. එයින් අදහස් කරන්නේ ඕනෑම පුරුෂයකුට ඕනෑම ස්ත්‍රියක සමග ලිංගික සම්බන්ධකම් පැවැත්විය හැකිය යන ආකාරයේ ලිහිල් බවක් මෙරට තිබූ බව ද නො වේ. එහෙත් කතෝලික චින්තනයෙහි මෙන් එක් පිරිමියකු තමන් මියයනතෙක් ම එක් ස්ත්‍රියක සමග වාසය කළ යුතු ය යන අන්දමේ දැඩි නීති රීති මෙරට චින්තනයෙහි නො වී ය. කලින් සඳහන්කර ඇති ආකාරයට සිංහලයන් අතර ආවාහ විවාහ කෙරුණේ හා අවලංගුකෙරුණේ සර්වබලධාරී දෙවි කෙනකුගේ කැමැත්ත මත නො වේ.

යම් පුරුෂයකුට හෝ ස්ත්‍රියකට හෝ අවශ්‍ය නම් සමාජයේ ද කැමැත්ත පරිදි විවාහයක් අවලංගු කිරීමේ හැකියාව තිබුණි. රොබට් නොක්ස් විවාහය සිංහලයන් අතර දරදඬු නො වී යැයි කියන්නේ මේ කරුණ මුල් කොටගෙන ය. එහෙත් ඒ අවලංගුකිරීම රොබට් නොක්ස් සිතූ අයුරින් ලිහිල් එකක් නො වී ය. ඔහු එහි ලිහිල් බවක් දැකීමට ප්‍රධාන හේතුව අවලංගුකිරීම යුරෝපයේ මෙන් අධිකරණයකට ගොස් කළ එකක් නො වීම ය. අධිකරණයක බලයට යටත්වන පරිදි විවාහ ලියාපදිංචිකිරීමක් ලංකාවේ නො වී ය. එවිට අධිකරණයකින් කටුගාදැමිය යුතු විවාහයක් මෙරට නො වී ය. එසේ වුවත් විවාහයකට මුළු ගමම සාක්ෂි දැරී ය. එබැවින් යම් යම් අවශ්‍යතා යටතේ ගම සාක්ෂි දරමින් විවාහය අවලංගුකිරීමේ හැකියාව ද ලංකාවේ විය.

ලංකාවේ විවාහය යන්න දෙදෙනකු අතර පමණක් කෙරෙන කාර්යයක් නොවේ. විවාහයක් යනු පවුල් දෙකක් අතර ඇතිකෙරෙන සම්බන්ධයකි. අද වුවත් විවාහයකින් සම්බන්ධවන්නෝ පුද්ගලයෝ දෙදෙනෙක් පමණක් නො වෙති. මෙරට යුරෝපයේ මෙන් නොව විවාහයකින් පවුල් අතර සම්බන්ධයක් ඇතිවෙයි. පතිනියක් පැමිණෙන්නේ පති කුලයකට ය. විවාහයෙන් ඒ කුල, එනම් පවුල් දෙක අතර සම්බන්ධයක් ඇතිවෙයි. භාරතයේ වුව ද තත්වය එසේම විය. ඇතැම්විට ගාන්ධර්ව නමින් හැඳින්වෙන විවාහයක මේ සම්බන්ධය එසේ ම නොවුනා විය හැකි ය. එහෙත් එවැනි විවාහයක වුව ද කෙටි කාලයක් ඇවෑමෙන් පවුල් සම්බන්ධයක් ඇතිවීම සාමාන්‍යය විය. අද වුවත් දෙමව්පියන්ගේ ආශිර්වාදය නැතිව විවාහවන යුවළක වුව ද ටික කාලයකට පසු ඒ ඒ පවුල් විසින් පිළිගැනෙනු පමණක් නොව ඒ ඒ පවුල් අතර ද සම්බන්ධයක් ගොඩනැගෙනු දැකිය හැකි ය.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ප්‍රතිඵලයක් ලෙස විවාහය යනු පෞද්ගලික දෙයක් බවට පත්විණි. එනම් විවාහයක් යනු පුද්ගලයන් දෙදෙනකු අතර කෙරෙන්නක් පමණක් විය. විවාහයක් ලියා පදිංචිකිරීමෙන් පසුව එය කටුගාදැමීමට, අවලංගුකිරීමට හැකියාව බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙන් ලබා දෙන ලදී. විවාහයක් අවලංගුකිරීම කතෝලික චින්තනයට පටහැණි විය. කතෝලික චින්තනයෙහි විවාහය අවලංගුකිරීමට බලය තිබුණේ දෙවියන් වහන්සේට පමණකි. උන්වහන්සේ එලෙස විවාහයක් අවලංගුකෙළේ එක් අයකු ස්වර්ග රාජ්‍යයට කැඳවීමෙනි. වෙනත් අයුරකින් කිවහොත් කතෝලික චින්තනයෙහි විවාහයක් අවලංගුවිය හැකිව තිබුණේ එක් අයකුගේ මරණයෙන් පමණකි.

එහෙත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසින් පුද්ගලයාට නිදහස ලබා දෙනු ලැබිණි. මේ නිදහස ලබාදීමේ දී බටහිර ක්‍රිස්තියානි නූතනත්වය දෙවියන් වහන්සේට හිමි බලතලවලට ඇඟිලි නො ගැසී ය. දෙවියන් වහන්සේගේ අයිතියට කිසිම වූ ආකාරයක බලපෑමක්, අභියෝගයක් කිරීමට බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අවශ්‍ය නො වී ය. එහෙත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය පාප්වහන්සේට නම් අභියෝග කෙළේ ය. පාප් වහන්සේ දෙවියන් වහන්සේ ගේ මිහිපිට නියෝජිතයා ලෙස කටයුතු කෙළේ ය.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වය දෙවියන් වහන්සේට අයත් දේ දෙවියන් වහන්සේටත්, සීසර්ට හෙවත් රජුට අයත් දේ සීසර්ටත් අයත් දේ ලෙසත් සැලකීමේ බයිබල් පාඨයට ආපසු ගියේ ය. බොහෝ කරුණු අතින් ගත්කල බටහිර නූතනත්වය බයිබලයට ආපසු ගියේ ය. මාටින් ලූතර් ආදී ක්‍රිස්තියානි නායකයන්ගේ අභිප්‍රාය වූයේ බයිබලයට ආපසු ගොස් දෙවියන් වහන්සේට අවශ්‍ය වූ කාර්යය ඉතා සාර්ථකව ඉටුකිරීම ය. දෙවියන් වහන්සේට අයත් දේ

© Prof. Nalin De Silva

උන්වහන්සේට ආපසු ලබාදීම යනු අන්කිසිවක් නොව පාප්වහන්සේගේ බලය අඩුකකිරීමක් විය. සීසර්ගේ බලය අඩුවීමක් ඉන් නො සිදුවෙයි.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට විවාහය අවලංගුකිරීම දෙවියන්වහන්සේට පමණක් පවරා, එනම් පාප්වහන්සේ කියන දෙයට පමණක් සීමාකර සිටීමට නො හැකිවිය. විවාහය සම්බන්ධයෙන් ගත්කල පෞද්ගලික නිදහස දීමට යමකුගේ මරණය තෙක් බලාසිටීමට බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට නො හැකි විය. මේ සම්බන්ධයෙන් එංගලන්තයේ අටවැනි හෙන්රි රජුගේ මැදිහත්වීම ද ඉතා වැදගත් විය. අටවැනි හෙන්රි රජුට තම බිසවගෙන් දික්කසාද වීමට අවශ්‍ය වූ නමුත් පාප්වහන්සේ එයට ඉඩ නුදුන්නේ ය. එවිට හෙන්රි රජු කෙළේ පාප්වහන්සේ ගේ නායකත්වයෙන් තිබූ කතෝලික පල්ලියෙන් වෙන් වී එංගලන්ත සභාව හෙවත් ඇංග්ලිකන් පල්ලිය තම නායකත්වයෙන් පිහිටුවාගැනී ම ය. ඒ පල්ලියෙන් අටවැනි හෙන්රි රජුට දික්කසාද වීමට නිදහස ලැබුණු බව අමුතුවෙන් කිවයුතු නො වෙයි.

මෙය අටවැනි හෙන්රි රජු සම්බන්ධ පෞද්ගලික කරුණක් නොවන බව අවධාරණය කළ යුතු ය. එකල යම් යම් හේතු මත තම විවාහ අවලංගුකරගැනීමට අවශ්‍ය වූ පුරවැසියන්, එනම් පිරිමින්, සිටි බව රහසක් විය නො හැකි ය. මේ පුද්ගල අවශ්‍යතාවට කතෝලික චින්තනයෙන් පිළිතුරක් සොයාගත නො හකි විය. ඒ පිළිතුර ලැබුණේ වර්ධනය වෙමින් පැවති බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙනි. එය පෞද්ගලිකත්වය වර්ධනයකිරීම පිළිබඳ වූ පොදු ප්‍රශ්නයට දුන් පිළිතුරක් විය.

එසේ වුවත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ඕනෑම පුද්ගලයකුට ඕනෑම අවස්ථාවක විවාහය අවලංගුකිරීමේ නිදහස ලබා නො දුන්නේ ය. එසේ කළ නොහැකි වූයේ විවාහය පල්ලියේ ලියා පදිංචිකළ එකක් වීමත් එය දෙවියන්වහන්සේගේ කැමැත්ත පරිදි සිදු වූ එකක් බව උපකල්පනයකිරීමත් නිසා ය. එහෙත් දෙවියන්වහන්සේ විවාහ වූ යුවළගෙන් එක් අයකු මරණයට පත්වීමට පෙර ඇතැම් අවශ්‍යතා යටතේ විවාහය අවලංගුකරන බව බටහිර ක්‍රිස්තියානි නූතනත්වය උපකල්පනයකර ඇති බව පැහැදිලි ය. එබැවින් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අවශ්‍ය වූයේ දෙවියන්වහන්සේ විවාහය අවලංගු කළයුතු බවට තීරණයකර ඇත් ද නැත් ද යන්න දැනගැනීම ය.

ඒ බව දැනගැනීම බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විනිසකරුවනට භාරදුන්නේ ය. එනම් පල්ලියේ සිදුකරන ලද විවාහය (පසුව විවාහය සිදුකිරීම ද අවශ්‍ය නම් පල්ලියෙන් පිටත දී ද ඒ සඳහා පත්කරන ලද ලියාපදිංචිකරුවන් ඉදිරියේ කිරීමට බලය දෙනු ලැබිණි.) අවලංගුකිරීම අධිකරණයට භාරදෙන ලදී. එහෙත් අධිකරණය තම තීන්දුව දෙන්නේ කිනම් පසුබිමක ද යන්න තීරණයකිරීමට අවශ්‍ය විය. එහි දී නැවතත් ඉස්මතු වූයේ පෞද්ගලිකත්වය ය.

විවාහ වූ යුවළ ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසින් සලකනු ලැබුයේ යම් බැඳීමක් තිබුණ ද පුද්ගලයන් දෙදෙනකු ලෙස ය. විවාහයෙන් පසු විවාහ වූ දෙදෙනා එක් ඒකකයක් ලෙස සැලකීමේ සම්ප්‍රදායක් බටහිර නො වීය. එබැවින් විවාහ වූ යුවළගෙන් එක් අයකු අනෙක් අයගේ කැමැත්ත, නිදහස, අයිතිය, විශ්වාසය ආදියට එරෙහිව ගියේ නම් ඒ අනෙක් තැනැත්තාට අධිකරණය ඔස්සේ විවාහය අවලංගුකිරීමේ අයිතිය ලබාදෙන ලදී. කෙසේ වුවත් ඒ විවාහය අවලංගුකිරීම අවශ්‍ය වූ පුද්ගලයා ඒ සඳහා අධිකරණයට යා යුතු ම විය. දෙවියන් වහන්සේගේ කැමැත්ත ප්‍රකාශකෙරුණේ අධිකරණය මගින් වීම එයට හේතුව විය.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසින් කරන ලද ප්‍රධාන ආකල්පීය වෙනසක් එලෙස සිදුවිය. කතෝලික චින්තනයෙහි දෙවියන්වහන්සේගේ කැමැත්ත දැනගත හැකි වූයේ පාප්වහන්සේ ඔස්සේ ය. එනම් පල්ලිය ඔස්සේ ය. එහෙත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ඒ වෙනස්කර දෙවියන් වහන්සේගේ කැමැත්ත සිවිල් (පල්ලිය නොවන යන අරුතින්) නිලධාරීන්, පුද්ගලයන් ඔස්සේ දැනගත හැකි යැයි තීරණය කෙළේ ය.

දෙවියන් වහන්සේගේ කැමැත්ත දැනගැනීමට හැකිවූයේ අධිකරණ නිලධාරීන්ට පමණක් නො වේ. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අනුව බටහිර විද්‍යාඥයන් කරන්නේ ද එයම ය. ඔවුහු ද දෙවියන් වහන්සේගේ කැමැත්ත ප්‍රකාශකරති. ඔවුන් කරන්නේ දෙවියන් වහන්සේ ලෝකය මවා ඇත්තේ කෙසේ දැයි තේරුම් ගැනීම ය. අයිසැක් නිව්ටන් පඬිවරයා ඒ බව පැහැදිලිව ම ප්‍රකාශකෙළේ ය. අද ද මේ ආකල්පවල මූලික වෙනසක් සිදු වී නැත.

© Prof. Nalin De Silva

බටහිර විද්‍යාව ආගමින්, එනම් ක්‍රිස්තියානි ආගමින් වෙන් වී ඇතැයි ඇතැම් අය පැවසුව ද, ඒ එසේ වී නැත. බටහිර විද්‍යාව කතෝලික පල්ලියෙන් හා චින්තනයෙන් නම් වෙන් වී ඇත. කතෝලික පල්ලිය හා බටහිර විද්‍යාව අතර අතීතයේ දී, එනම් බටහිර විද්‍යාව ආරම්භ වූ යුගයේ දී ප්‍රතිවිරෝධතා ඇතිවූයේ එබැවිනි. එහෙත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ඇති වූ කතෝලික නොවන විවිධ ක්‍රිස්තියානි ආගම්වලට ඒ ප්‍රශ්නය නො වී ය. ක්‍රිස්තියානි ආගම හා බටහිර විද්‍යාව අතර සමස්තයක් ලෙස ගත්කල වූයේ සුහදත්වයකි. බටහිර විද්‍යාව පෝෂණයකරනු ලැබුයේ ක්‍රිස්තියානි ආගම විසිනි.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ඉහත සඳහන්කළ ආකාරයට විවාහය අවලංගුකිරීමේ අයිතිය අධිකරණයට පවරාදුනි. එහෙත් එය ලිහිල් කටයුත්තක් නො වී ය. විවාහපත් යුවළගෙන් එක් අයකු හෝ දෙදෙනාම හෝ අධිකරණය ඉදිරියට ගොස් විවාහය අවලංගුකිරීමට (දික්කසාදය - මෙය රෙපරමාදු ක්‍රිස්තියානිය අදහන රටක් වූ ඕලන්දයේ - අද නෙදර්ලන්තයේ - භාෂාව වන ලන්දේසි බසින් සිංහලයට ලැබුණු වචනයකි. ලංකාවේ භාවිතාවන නීතිය හැඳින්වෙන්නේ ද රෝම ලන්දේසි නමිනි.) ඉල්ලුම් කළයුතු විය.

රොබට් නොක්ස් දහහත්වැනි සියවසේ ලංකාව පැමිණියේ එංගලන්තයෙනි. එවකට එංගලන්තය බටහිර ක්‍රිස්තියානි නූතනත්වය යටතෙහි වර්ධනය වෙමින් පැවතිණි. අයිසැක් නිව්ටන් පඬිවරයා එංගලන්තයේ උපන්නේ 1642 වසරේ දී ය. රොබට් නොක්ස් දැනසිටි, පුද්ගලයන් දෙදෙනකු අතර වූ විවාහය අඩුම තරමින් එක් අයකු අධිකරණයට ගොස් ඒ ඔස්සේ අවලංගුකර ලිය යුතු විය. එහෙත් එකල ලංකාවේ එවැනි පද්ධතියක් නො වී ය. රොබට් නොක්ස් ලංකාවේ සිංහලයන් අතර පැවති විවාහය අවශ්‍ය වූ විටක අවලංගුකළ හැකි වුවක් ලෙස දුටුවේ එවැනි පසුබිමක ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva